ජීවිතේ සුන්දර ද කෙතරම්?

"ජී... විතේ සුන්දර ද කෙතරම්?"

පින්සල උදේ පාන්දරම "කිචන් එෆ් එම්" එකේ උදා විකාශය පටන් අරන්.

"මොකද රුකාන්ත මහත්තයාගේ සින්දුවකින් උදේ පාන්දරම?" පන්හිඳ අහුවේ පින්සලට බාධා කරගෙන.

"නෑ මේ පනුගිය දවස්වල ආව-ගිය තැන, කරපු-කියපු දේවල් ගැන මතක් වෙනකොට ඉබේම ඔය වාගේ සින්දු තමයි මතක් වෙන්නේ" පින් සින්දුවේ ඉතුරු ටික කියන්න උත්සාහ කළා. ටිකක් අමාරුයි වගේ.

"ඉකි ගසා හඬන..... මට මගේ නො වන ආදරයක් තිබුණා" පදන්සලත් අදෑ උඩ ඉඳගෙන ම "කිචන් එෆ්. එම්" නාලිකාවට සම්බන්ධ වුනේ දුරස්ථ විකාශයක් විදියට. ඒ අමරසිරි පීරිස් මහත්තයාගේ සින්දුවක්. පන්ටත් බලා ඉන්න බෑ. "සොඳුර මට සමුදෙන්න- සමු-දෙන්න" උදේට ගැලපෙන ඩී. ඩී. ගුණසේන මහත්තයා කාලෙකට ඉස්සර ගායනා කරපු සින්දුවක්.

"හොඳ සුන්දර වැඩක් කළා ය කියලා කියන්න පුළුවන් දෙයක් කළා ම අත්තට ම දැනෙන්නෙ පුදුම සතුටක්. අත්තටම ආත්ම තෘප්තියේ උපරිම" පන් කිව්වේ අත්තටම සතුටින්.

"මැක්සා මවං!" ඩී.ඩී. ගුණසේන මහත්තයාගේ "සිව් තත් සරණිය" වයලින් වාද්‍ය ප්‍රසංගය කාවයට ගන්න ගමන් "දුම්" කිව්වේ "බොක්කෙන් ම යි" පැන් ට අහුණ දෙයක් ඒ. "දුම්" කිලයා කෙටියෙන් අපේ කටිටිය කතා කරන්නේ දුෂාන් බුලත්සිංහල ඡායාරූප ශිල්පියාට.

දැන් අපිත් එක්ක මෙල්බන්වල ජීවත් වෙන ප්‍රවීණ වයලින් වාදන ශිල්පියා වෙනුවෙන් සංවිධානය කරපු "සිව් තත් සරණිය" ප්‍රසංගය එතුමාගේ ගායන, වාදන හැකියාවන් පෙන්වපු සාර්ථක ප්‍රසංගයක් වුණා. හිගතමානී, හිඟඩ කලාකරුවෙක් වෙනුවෙන් ෆාගිමි මස්පිඩි හිතවතා මූලික වෙලා සංවිධානය කරපු මේ උපහාර ප්‍රසංගයේ සංගීතයේ මෙහෙයෙවීවේ ඉන්දුජිත් මිරිහාන තරුණ සංගීත ශිල්පියා. වැඩසටහන නිවේදන කටයුතු කරමින් මෙහෙයෙවීවේ සහන් වීරසේකර සොහොයුරා. ආලෝක කරණය සුජිත් බණ්ඩාර සොහොයුරාගෙන්. නාමල් ප්‍රේමරත්න මල්ලි හරිගස්සලා දුන්න දර්ශන ටික ප්‍රදර්ශනය කරන්න එකතු වුණේ භාණුක මනෝරත්න මල්ලි. මොකද නාමල්ට වැඩ ගොඩක් පැවරිලා තිබුණ හන්දා. වාදක මණ්ඩලයට අතඅළු හැම දෙනාම මේ දේවල් කළේ නොමිලයේ. උපහාර පළකය ප්‍රධානය කළේ බන්දු දිසානායක මහත්තයා. ප්‍රසංගයේ ආදායමෙන් වියදම් පියවලා ඉතුරු ටික ගුණසේන කලාකරුවාට පිරිනැමුවා. ඒ එතුමාගේ ගෙදරදී. ඒකත් හරියට හිතට දැණුන වෙලාවක් වුණා.

මේ දේවල් වලට උදව් කරපු පත්තර, රේඩියෝ, රූපවාහිනී වලටයි, අන්තර්ජාත වෙබ් අඩවි වලටයි, කලින් කියපු හැමෝට මයි ගුණසේන මහත්තයා ස්තූතිය පළ කළේ හරිම සංවේදීව. ගායනයෙන් සහාය දුන්න අයවත් මතක් කළේ සෙනෙහසින්.

"කාලෙකින් හොඳ චිත්තරපටියක් දැක බලා ගන්න ලැබුණා" පැන් මාතෘකාව වෙනස් කළා.

ජයන්ත චන්ද්‍රසිරි මහත්තයා අධ්‍යක්ෂණය කරපු " සමනල සන්ධිවතිය" චිත්‍රපටිය ඇත්තටම අගය කරන්න ඕන. දර්ශන රුවන් දිසානායක තරුණ සංගීතවේදියාගේ සංගීතයත් හරියටම පෑහුණා. අපිත් සිල්වා, වර්නන් තිසේරා ඇතුලු අපේ හිතවතුන්ට ස්තූතිකරන්න ඕන දෙවෙනි වතාවටත් ප්‍රදර්ශන වාරයක් සංවිධානය කළාට. තව ඩිංගෙන් මඟහැරෙනවා. මඟ හරින්න බැරි විදිහේ නිර්මාණයක් ඒක.

මේ ඉන්න අපේ අය අතරේ සින්දු කියන්න කැමති උදවිය එකතු වෙලා සංවිධානය කරන සාජ්ජ දැන් කීප පොළකම පැවැත්වෙනවා. මීට අවුරුද්දකට කලින් පටන් ගත්ත "ගී දැහැන" සාජ්ජය ඒ අතරින් කැපී පෙනෙනවා. ජනප්‍රිය සින්දුවල සංගීත හඬ තීරය, එහෙම නැත්නං "මියුසික් ට්‍රැක්" වලට ගායනයට උනන්දු අය ගීත ගායනා කරන්න මාසෙකට සැරයක් එකතු වෙනවා. "කැරොකේ" විදියට සින්දු කියන එකයි මේ ගායනා එකතුවලදි කෙරෙන්නේ.

තමුන්ට ගැලපෙන විදිහේ කූඩා ශාලාවක් වෙන් කරගෙන, ශබ්දවාහිනී යන්ත්‍ර පාවිච්චි කරලා කරන මේ ගායනා වලට හඬ තීරු වාදනය කරන්නේ ඕගන් එකෙන්. "ගී දැහැනේ" මූලිකයා විදියට වැඩ කරන ජයන්ත සමරක්කොඩි හිතවතා ළඟ මේ වගේ හඬ තීරු දාහකට වැඩිය ඇති කියලයි හිතෙන්නෙ. ඒ වගේ ම ඒ සින්දුවල පද මාලාවල් සේරම ලොකු සී. ආර්. පොත්වල ලියලා අංක දමලා බොහොම පිළිවෙලටයි ජයන්ත මේ කටයුත්ත කරන්නේ. අත්තට ම සින්දු කියන්න කැමති අය වෙනුවෙන් කරන ලොකු සේවයක් මේක.

ජයන්තට මේ දේ කරගෙන යන්න චානක රාජපක්ෂ, චින්තක ප්‍රනාන්දු, කපිල ප්‍රනාන්දු කියන අයත් හවුල් වෙනවා. හිමල් ඒකනායක හිතවතා තමයි සින්දු කියනවාට අමතරව නිවේදන කටයුතු කරන්නේ. තාක්ෂණික පැත්තෙන් සුමිත් පෙරේරා මල්ලිත් උදව් දෙනවා. සංවිධාන කටයුතු වගේ ම උපදෙස් දෙන්න නන්ද තිලකරත්න මහත්තයත් හවුල්.

වැඩිහිටි ඇසෝ සින්දු කියනවා වගේ ම කූඩා ඇසින්ටත් ඉඩක් තියෙන එක ලොකු දෙයක්. සිළුන බාලසූරිය කූඩා දරුවා අනිවාර්යයෙන්ම හැම වාරයකදීම වයලින් වාදන දෙකක් ඉදිරිපත් කරනවා. ගායනා කරන්න, ගිටාර් වාදනයට එකතු වුණ අයත් ගිය අවුරුද්ද පුරාම දකින්න ලැබුණා.

ඉතින් ඔය විදියට මාසිකව එකතුවෙන "ගී දැහැන" සාජ්ජයට අවුරුද්දක් පිරෙන උත්සවය ඉහළින් පැවැත්වුණා. තිස් දෙනෙකුට වැඩි පිරිසක් සින්දු කිව්වා. ඒ කියන්නේ ඔක්කොම සින්දු හැටකට වැඩියි. හොඳට සංවිධානය වුණේ හැත්නං මේක බොහොම අමාරු කාරියක්. පවුල්වල නෑ හිතවතුන්ටත් බලන්න එන්නත් ඉඩ තියලා ලොකු ශාලාවක් වෙන් කරගෙන තිබුණා. ඒ නිසා සුළු මුදලකට ටිකට් පත් විකුණන්නත් වුණා. හැබැයි ඒ රසවත් කොත්තු වේලකටත් එක්ක.

මෙල්බන්වල අපේ කටයුතු වලදී අපි දැකපු කලාත්මකම, ලොකුම වේදිකා සරසිල්ල අරන්, ලොකු වියදමක් දරාගෙන, ලොකු කැපවීමක් කරලා ඒක නිර්මාණය කළේ සුමිත් පෙරේරා මල්ලි. බොහොම ගාම්භීර විදියට නිවේදන කටයුතු කළේ හිමල් ඒකනායක හිතවතා. ශාලාව වෙන් කරගන්න එකේ ඉඳන් අවසානය වෙනකල්ම සංවිධාන කටයුතු වලට මූලික වුනේ නන්ද තිලකරත්න මහත්තයා. චානකයි, චින්තකයි, කපිලයි ඒකට සහාය වුණා. සුපුරුදු විදියට හඬ තීරු වාදනය කරන ගමන් වේදිකාවේ කටයුතු බලාගත්තේ ජයන්ත සොහොයුරායි.

හැම දෙයක්ම කෙරෙන්නේ නොමිලයේ. ඒත් ශාලාවට ගෙවන්න ඕන කරන සුළු මුදල එකතු කරගන්න " පරිත්‍යාග" පෙට්ටියක් තියලා තියෙනවා. තමුන්ට කැමති මුදලක් ඒකට දැම්මැකි. සාමාන්‍යයෙන් ගණන ඩොලර් පහකට වඩා වෙන්න ඕන නෑ. එක් කෙනෙකුට අවස්ථා දෙකක් ලැබෙනවා. මට දෙකකටයි ඉදිරිපත් කරන්න ඉඩ දෙන්නෙ. එක වටයට එක ඉදිරිපත් කිරීමයි කරන්න පුළුවන්.

මේ එකතු වෙන අය කෑම බීම එහෙමත් අරගෙනයි එන්නේ. ශාලාව ඇතුලේ මත්පැන් තහනම්. නටන්න තහනම්. සින්දුව ඉදිරිපත් කරන එකට අවධානය යොමු කරන්න ඕන නිසයි ඒ. සාජ්ජය පටන් ගන්න කලියෙන් ශාලාව පිළියෙල කරගන්න එකයි, ඉවර වුණා ම අස් කරන එකයි කර ගන්නෙත් තම තමන්මයි.

හැම දෙනාම වෙලාවට, පිළිවෙලට ප්‍රමාදයක් නැතිව අපූරුවට කෙරුණා. වට දෙකකට සින්දු කිව්වට පස්සේ නටන්න කැමති අයටත් ඇති තරම් නටන්න බයිලා සින්දුත් ප්‍රචාරය කළා. හැමෝම විනයක් ඇතිව හැසිරුමෙන් සින්දු කියන අයගේ හපන්කම් බලන්න තිබුණ උනන්දුව හන්දා වෙන්න ඕන. ඒ අතරේ සිළුණ බාලසූරිය පුතාගේ වයලින් වාදන දෙකක්, කීර්ති විජේසිංහ හිතවතාගේ මවුත් ඕගන් වාදනයත් සුමිත් පෙරේරා මල්ලිගේ ඕගන් වාදනයත් සාජ්ජයට වෙනසක් එකතු කළා.

ඇත්තට ම "ගී දැහැන" තවත් සුන්දර මෙල්බන් අත්දැකීමක් වුණා. හැමෝගේ ම සහයෝගය, සාමූහිකත්වය ඇතිව කරපු සාර්ථක හොඳ වැඩක්. ඒ වගේම මෙල්බන් නගරයේ බටහිර ප්‍රදේශයේ පවත්වන "මියුරු සර" සාජ්ජයත් එක්ක අත්වැල් බැඳගෙනයි මේ ගමන යන්නේ. "මියුරු සර" සංවිධානය කරන්නේ ඩඩ්ලි, ලලිතා විමලනිස්ස යුවල. ඒ සාජ්ජයේත් හඬ තීරු වාදනය කරවන්නේ ජයන්ත සමරක්කොඩි ම යි. මාසිකව මේ දෙගොල්ල සාජ්ජ දෙකටම පුළුවන් විදියට දායක වෙනවා. "ගී දැහැන" වාර්ෂික ප්‍රසංගයට "මියුරු සර" කණ්ඩායමේ දායකත්වයත් ඉහළින්ම ලැබුණා.

"අවුරුද්දකට කලින් සින්දු කියන්න පටන් ගත්ත කාලේ අපේ අය කිව්වට වැඩිය ගොඩක් හොඳට මේ උත්සවයේදී සින්දු කිව්වා. ඒ අයගේ ප්‍රගතිය දකින්න ලැබෙන එක ලොකු සතුටක්!" ජයන්ත සමරක්කොඩි හිතවතා ඉහවහා යන අවංක සතුටින් කිව්වා. ප්‍රසංගයට ඉදිරිපත් කිරීම් කරපු අයටත්, සහයෝගය දුන්න අයටත්, බලන්න ආව අයටත් ජයන්ත ස්තූති කළේ ලෙන්ගතුකමින්.

ඉතින් මේ සුන්දර දේවල් විඳලා පන්-පින්-පැන් තුන්දෙනාටම තියෙන්නේ ඇත්තටම ලොකු සතුටක් කියලා අයෙත් අමුතුවෙන් කියන්න දෙයක් යැ?

---

18 වන පිටෙන්

..වරෙල්ල යමු කතා කරන්න..තවත් මොහොතකදී මේ සොඳුරු මිනිසා වටා අපේ කරදරකාරයින් රොක්වේ..

මහින්ද අය්ය අපි ආවට කමක් නැනේ..පළ්ලෙලා කෑ ල්ල අද අපි බුක්. අද අය්යත් අපිත් එක්ක පාර්ටි එක සමරන්න ඕන.. එකෙකු මිවිත් සැර වැඩිවි දොඩමලුවේ

හා..හා හරි ඉතින් මොකක්ද පාර්ටිය .අල්ගමයන් සිනා සිසි අසයි .

මේ අපේ එකෙක් අද සාෆ් ගීත රචනාවක් දිනන්නේ එකයි . අපට මෙය විශේෂයක් උනාට මෙය එතරම්ම විශේෂයක් ඔහුට නොවේ. සුපුරුදු ඔහුගේ කතා බහත් අතරේ අපේ අය රුක් අත්තන මල මුදුනේ ගීතය ගායනා කරනු ලබයි. මා අසලින්ම සිටින අල්ගමයන් ගුප්ත වූ සිනා මුව රඳාගෙන ..ඉතින් දැන් තව නිර්මාණ කරන්න බලන්න... හොඳ දෙයක් කරන්න මහන්සිවෙන්න ඕනේ..මා හා කතා බහට එකතුවේ ..මම දැන් මගේ පුරාජේරුව කියන්නට පටන් ගනිමි.

අය්යා කියන්නේ මම ඕක ලිව්වේ excident එකක් වෙලා ඉන්න කොට ..මන් දන්නවා ..ඔය තරගෙට කටිටිය දාහක් දෙදහකට වඩා ලිව්වා..ලේසි නැහැ .. අනික මේ ගී තෝරලතියෙන්නේ වෙනම special කටිටියක්. මෙය කියනවිට..මහින්ද අල්ගමයන් මගේ මුහුණ දිහාම බලාගෙන සිනාවූ මුහුනින්ම සිටි. මට දැන් දැන් කුතුහලයකි. මොහු මේ සතේකටවත් ගණන් නොගෙන ඉන්නේ ඔහු ගීත රචකයෙක් නිසා වෙන්නැති. වැඩියෙන් කියන්න ගිහින් කොලේ ඉරගත්තා නේදෝයි මගේ සිත මට කියයි ..මහින්ද අය්යගේ හඬ අවදිවේ..

නෑ ..මල්ලි කියන්න මම අහගෙන ඉන්නේ..ඔයාගේ ගීය කියන්නේ අයිවෝ ඩෙහිස් මහත්තයනේද? මෙය අසනවිට මාගේ තොල කට වියලුනි. දෙය්යනේ කොහොමද මෙයා දන්නේ ..තාම ගුවන් විදුලියේ අයත් දන්නේ නැනේ. ප්‍රචාරය වෙන දවස තව ඉස්සරහටනේ තින්නේ.සිතට තවත් ගැටලුවකි

මල්ලි ඔය ගීතය මමයි තේරුවේ ..මහින්ද අය්යා සිනාසී එසේ කියනවිට මගේ උජාරුවව බින්දුව දක්වාම බැසෙ ගොසිනි. වස ලැජ්ජාවකි .. මා අවට සිටි ගිතවතුන්ට ද මෙය රහසක් නොවීය. මේ සිදුවීම මගේ ජීවිතයේ අදටද මහගු අත්දැකීමකි. සියල්ල විඳදරා ගෙන තමන් සතු ශක්තිය පමණට බුත්තිය විඳින්නට මේ සොඳුරු මිනිසා පුරුදු කළේය. සාදය හමාර වන විට ලැබුන ත්‍යාග මුදලට වඩා වැඩිපුර යමක්ද වියදම් වී හමාරය. එනමුදු එදා ගතකල සවස සුන්දරවූ මතක සටහනකි.

සාදයෙන් පසුව මා මහින්ද අල්ගම මහතාව නිවසට ඇරලවීමි. ඒ නිවසේ ගතකලේ ඔහුත් ඔහුගේ මවත් පමණි. ගිය විගසම වගේ පෙන්වුයේ බොහෝ පොත් පත් ඇති පුස්තකාලයක් බඳුවූ පොත් රාක්ක පෙළයි. මා ඔහුගේ මවට හඳුන්වාදී ඔහු නොසිටියත් පොතක් ගන්නට අවොත් දෙන ලෙස අවසරය ලබා දෙන ලදී. මා මෙවැනි අයකු දැක්කේ ප්‍රථම වරටය. මක්නිසාද යත් බොහෝ උදවිය පොත් පත් නොබැලුවත් පොතක් දැක්ක විට ඉල්ලන්නේ කියවන අටියෙනි. නමුත් ඒ පොත කවදාවත් නොලැබෙන්නේය. මහින්ද අල්ගම නම්වූ සොඳුරු පුද්ගලයා එසේ හඳවතින් යමක් පැවසුවේ තවත් කෙනෙකුගේ දියුණුවකට උදව්වක් ලෙසිනි. අප හැර ගියත් රුක් අත්තන මල සුවඳමය.

සන්නස
බලන්නට ඇති පත්තර අතර
සියුම්ම්ම්ම්ම ඇති පත්තරයක්